# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2134/50- 2019 අගෝස්තු මස 02 වැනි සිකුරාදා - 2019.08.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස - (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1928 අංක 31 දරන උද්භිද උද්‍යාන ආඥාපනත

1973 අංක 32 දරන පනතින් සංශෝධිත 1928 අංක 31 දරන උද්භිද උද්‍යාන ආඥාපනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**ජෝන් අමරතුංග,**
සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය.

2019 ක් වූ ජුනි මස 06 වැනි දින,
කොළඹ දීය.

නියෝග

1. මේ නියෝග 2019 උද්භිද උද්‍යාන (ඇතුලුවීමේ ගාස්තු ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර වර්ෂ 2019 අගෝස්තු මස 05 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. යම් උද්භිද උද්‍යානයකට තැනැත්තන් සහ වාහන ඇතුලුවීමේ දී අය කරනු ලැබිය යුතු ගාස්තුවල අනුප්‍රමාණ, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතුය.

1A - G 30652 - 67 - (2019/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එසේ වුව ද පහත දැක්වෙන තැනැත්තන්, එසේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු ගෙවනු ලැබීමෙන් නිදහස් වන්නේ ය :

(අ) ශ්‍රී ලංකා ජනරජයේ අමුත්තන්,
(ආ) උද්භිද උද්‍යාන තුළ පිහිටි නිවාසවල පදිංචිකරුවන්,
(ඇ) නිල කාර්ය සඳහා උද්භිද උද්‍යානයට ඇතුලුවන රජයේ නිලධාරීන්,
(ඈ) ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිදහස් කරනු ලබන, වෙනත් යම් තැනැත්තකු.

එසේම තව දුරටත්, වාහන ඇතුලුවීම නොකරන උද්භිද උද්‍යානයන්ට අදාළව, ඒ ඒ උද්භිද උද්‍යානයේ භාරකරු විසින් අවසර දෙනු ලබන වාහන නොවන්නා වූ කිසිදු වාහනයකට ඒ ඒ උද්භිද උද්‍යානයන්ට ඇතුලුවීමට අවසර දෙනු නොලැබිය යුතු ය.

3. 2010.12.22 වැනි දිනැති අංක 1685/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 2011.04.06 වැනි දිනැති අංක 1700/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* හා 2016.05.27 දිනැති අංක 1969 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධනය කරන ලද උද්භිද උද්‍යානවලට ඇතුලුවීමේ නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

### උපලේඛනය

(1) **තැනැත්තන් (එක් පුද්ගලයකුට) :-**

(අ) *ශ්‍රී ලාංකිකයන්* :

| | *රු. ශත* |
|---|---|
| 1. වැඩිහිටියන් සහ වයස අවුරුදු දොළහට (12) වැඩි ළමයින් | 100. 00 |
| 2. වයස අවුරුදු දොළහට (12) අඩු ළමයින් සහ පාසල් ළමයින් | 20. 00 |
| 3. වයස අවුරුදු හැටට (60) වැඩි වැඩිහිටියන් (ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම මත) | 20. 00 |

(ආ) *විදේශිකයන්* :

| | *රු. ශත* |
|---|---|
| 1. වැඩිහිටියන් සහ වයස අවුරුදු දොළහට (12) වැඩි ළමයින් | 2,000. 00 |
| 2. වයස අවුරුදු දොළහට (12) අඩු ළමයින් | 1,000.00 |
| 3. පාසල් ළමයින් සහ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් (උද්භිද උද්‍යානයේ භාරකරු සෑහීමකට පත්වන පරිදි අදාළ ලිපිලේඛන ඉදිරිපත් කිරීම මත) | 1200.00 |

(2) **වාහන (එක් එක් වාහනයකට )** :

| | *රු. ශත* |
|---|---|
| 1. කාර්, ජීප් රථ, ස්ටේෂන් වැන් රථ සහ ත්‍රිරෝද රථ | 250.00 |
| 2. මෝටර් බයිසිකල් සහ මෝටර් ස්කූටර් | 100.00 |
| 3. පාපැදි | 50.00 |

(3) **ගම්පහ (හෙනරත්ගොඩ ) උද්භිද උද්‍යානයේ හා සීතාවක වියළි කලාපීය උද්භිද උද්‍යානයේ බෝට්ටු අංගනයට බෝට්ටු පැදීමේ අදහසින් ඇතුලුවී බෝට්ටු පැදීම සඳහා** :

| | *රු. ශත* |
|---|---|
| දෙදෙනෙකුට පැය භාගයක කාල සීමාවක් සඳහා | 300.00 |

(4) **බැටරි කාර්** :

| | *රු. ශත* |
|---|---|
| 1. ආසන 08 බැටරි කාර් | 2,000.00 |
| 2. ආසන 03 බැටරි කාර් | 1,000.00 |

08-612

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.